## 2018 අගෝස්තු මස සාංඝික පවුල් දින සුපුවත

01. ප්‍රශංසාවට යොමුව :

**"සියල්ල ඔවුන් වහන්සේ කරණකොට ගෙන මවන ලදී. ඔවුන් වහන්සේ නොමැතිව මවන ලද කිසිවක් නොවීය."** (ශු.ජොහාන් 1:3)

"ඔවුන් වහන්සේ කරණකොට ගෙන" එනම් සියල්ල උපත ලබා ඇත්තේ ධර්මයාණන්, වාක්‍යාණන් වන ක්‍රිස්තුන් වහන්සේ කරණකොට ගෙනය. දෙවියන් වහන්සේගේ වචනයෙනි.

**"දෙවියන් වහන්සේගේ වචනයෙන් විශ්වය මවනු ලැබූ බව අප තේරුම් ගන්නේ ඇදහිල්ලෙන්ය. මෙසේ දෘෂ්‍යමාන දෙය, අදෘශ්‍යමාන දෙයින් පහළ වූ බව පෙනී යයි.** (හෙබ්‍රෙව් 11:3)

**"සෑම මැවිල්ලක්ම දෙවියන් වහන්සේගෙන් නික්මෙන වචනයක් වෙයි; ඒ හැමෙකක්ම දෙවියන් වහන්සේව ප්‍රකාශ කරන බැවිනි."** (ශු.බොනවෙන්චර් මුනිතුමා)

මැවිල්ලෙන් නික්මෙන දෙවියන් වහන්සේගේ වචන මෙනෙහි කරමින් අපි ප්‍රශංසාවට ඇතුළු වෙමු.

පුබුදු ගී අංක 135 "සකල මැවිල්ලට...." පුබුදු ගී අංක 55 "සමිඳුනි ලස්සන..."

02. දවසේ සුපුවත :

i **දෙවියන් වහන්සේ තම ස්වරූපය අනුව මිනිසා මැවූ සේක. පුරුෂයාද ස්ත්‍රියද වශයෙන් ඔවුන් මැවූ සේක.** (උත්පත්ති 1:27)

මැවුම්කරුවාණන් මිනිසාට අනගි තිළිණයන් රැසක් ප්‍රදානය කර ඇත.

* සතා සිව්පාවුන්ට සම නොවූ අනගි සුවිශේෂී ශරීරයක්
* විචාරයට, කල්පනාකාරී වීමට බුද්ධියක්
* තීරණ ගැනීමට නිදහස් කැමැත්තක් හා
* හොඳ නරක තීරණය කිරීමට හෘද සාක්ෂියක්ද ලැබී ඇත.

(අ) * ස්වභාවික නීතිය යනුවෙන් හඳුන්වන්නාවූ හෘද සාක්ෂිය "සවිඥානිකව (දැනුවවත්ව) තම වගකීමට අවදි වන සෑම මිනිසෙකුටම යහපත ඉටු කරමින්, අයහපත වලක්වාලීම සඳහා වන ඇතුලාන්ත හඬ ශබ්දයක් තමන් තුළ පවතින බව අත්දකියි. "

අපි හෘද සාක්ෂියට සවන් නොදීම, දේව වචනයට සවන් දීමෙන් ද අපව ඈත් කරයි.

**"දේව වචනයට සවන් දීම සියල්ලටම ප්‍රථමයෙන් අප මෙහෙයවනුයේ මිනිස් හදවත් තුළ ලියා ඇති, මෙම නීතියට අවනතව දිවි ගෙවීමේ අවශ්‍යතාවය අගය කිරීමට ය."** (xvi වන බෙනඩික් ශු. පියතුමා)

* **"ව්‍යවස්ථාවේ නියමයන් ඔවුන්ගේ සිත්හි ලියවී ඇති බව ඔවුන්ගේ පැවැත්මෙන් පෙනේ. ඔවුන්ගේ හෘදය සාක්ෂිය එය සැබෑ බව සහතික කරයි. මන්ද ඔවුන්ගේ සිතුවිලි සමහර විටක ඔවුන් සදොස් බවත්, සමහර විටක ඔවුන් නිදොස් බවත් හඟවන බැවිනි."** (රෝම 2:15)
* **"එහෙත් මාගේ මනසෙහි ඇති ඒ නීතියට විරුද්ධව සටන් කරන මාගේ ඉන්ද්‍රියයන් තුළ වූ පාප නීතියේ වහල්කමට මා හෙළන, වෙන ප්‍රතිපත්තියක් මාගේ ඉන්ද්‍රියයන් තුළ ඇති බව මට පෙනේ."** (රෝම 7:23)

(ආ) සාකච්ඡාව :

1. හෘද සාක්ෂිය යනු කුමක්ද?
2. හෘද සාක්ෂිය සහ දේව වචනයට සවන්දීම අතර සම්බන්ධතාවය කුමක්ද?
3. හෘද සාක්ෂිය පිළිබඳව ශුද්ධ ලියවිලි පාඨ දෙකෙන් ලැබෙන පණිවුඩය කුමක්ද?

ii * රෝම7:23

* ශුද්ධවූ පාවුළුතුමා පවසන පරිදි ක්‍රිස්තුන් වහන්සේ කරණ කොට ගෙන අප නිදහස ලබන්නේ අප වහල් බවට පත් කරන පාපයේ නීතියෙනි. **"යහපත කිරීමට කැමැත්තක් මට ඇතත්, එය ඉටු කිරීමට ශක්තියක් මට නැත"** (රෝම 7:18)
* අපගේ මනස තුළ වූ පාප නීතියේ වහල් කමට අපව පොළඹවන "වෙන ප්‍රතිපත්තිය" ක්‍රිස්තුන් වහන්සේ පරාජය කළ සේක.
* **"ඔබගේ පියවරුන්ගෙන් ලැබූ නිෂ්ඵල ජීවිත මාර්ගයෙන් ඔබ මුදනු ලැබුවේ රන් රිදී වැනි දිරා යන දේවල් මගින් නොව, කැළැලක් වත්, පලුද්දක් වත් නැති බැටළු පැටවකුගේ ලේ වැනි ක්‍රිස්තුන් වහන්සේගේ අගනා ලෙය කරණ කොට ගෙන බව ඔබ දන්නහුය."** (1පේදුරු 1:18-19)

* හෘද සාක්ෂියට සවන් දීමට අපට තිබූ නොහැකියාවට ක්‍රිස්තුන් වහන්සේගේ ගැළවීමේ බලය කරණාකොට ගෙන අපට මිදීම ලැබී ඇත. එහි සහතිකය අප ලබා ඇති ශුද්ධාත්මයාණන් වහන්සේය.
* ශුද්ධවූ පේදුරු තුමා පවසන පරිදි,
  පියවරුන්ගේ ලැබූ නිෂ්ඵල ජීවිත මාර්ගයෙන් ක්‍රිස්තුන් වහන්සේ අගනා ලෙය කරණා කොට ගෙන අපව මුදා ගෙන ඇත.
  දැන් වරප්‍රසාදයේ මාර්ගයෙන් මිනිසාට දේව පුත්‍රභාවය අත්දකිමින් තමන් සතු බැරිභාවය අභිබවා නැගී සිටීමට බලය ලැබී ඇත.
  **"ශුද්ධාත්මයාණන් පැමිණි කළ ඔබ බලය ලබන්නහුය."** (ක්‍රියා 1:8)

03. බෙදා ගැනීම :
1. පිබිදුන කිතුනුවෙකු වීමට පෙර ඔබ ජීවිතයේ අත්දුටු නිෂ්ඵල ජීවිත මාර්ගයන්ගෙන් දැන් මිදීම ලබා තිබේද?
2. "යහපත කිරීමට" මට දැන් ක්‍රිස්තුන් වහන්සේ කරණාකොට ගෙන දේව වරප්‍රසාදයෙන් "ශක්තිය" ලැබී ඇතැයි ඔබ අත්දකිනවා ද?

iii * ක්‍රිස්තුන් වහන්සේ තුළ නැවත උපත ලැබූවන් ලෙස ඔවුන් වහන්සේගේ වචනය මත තම ජීවිතය ගොඩනගා ගැනීම අපගේ කැඳවීමයි. දේව වචනය මත අපට ජීවිතය ගොඩනගා ගැනීම ස්ථිරත්වයක් හා ස්ථාවරත්වයක් අපට ගෙන දෙයි.
* ශු.මතෙව් 7:24

* දේව වචනය යථාර්ථය (පවතින ඇත්ත) පිළිබඳව අප තුළ පවතින සංකල්ප වෙනස් කිරීමට අපව පොළඹවයි.
  යථාර්ථවාදියා යනු සියල්ලේ පදනම දේව වචනය තුළ පවතින බව හඳුනා ගන්නා තැනැත්තාය.
  මේ යථාර්ථවාදී දැක්ම, තත්කාලීන යුගයේ විශේෂ අවශ්‍යතාවයකි.
* වස්තු සැප සම්පත් ආශ්වාදයන්, පරිභෝජනවාදය මිනිස් හදවතේ සිතැගියාවන් ඉටු කිරීමට අපොහොසත් බව අප දැනගත්තේ අපි අනපේක්ෂිත රෝගී තත්ත්වයකට, ජීවිත අභියෝගයකට, අපට පාලනය කරගත නොහැකි ස්වභාවික ආපදාවකට, මිනිස් ආදරය අහිමි වීමකට, මානසික කඩා වැටීමකට මුහුණ දුන් විටය.
* ධනවාදය, සමාජ වාදය, ලිබරල් වාදය වැනි විවිධ වාදයන් ලෝකය ගලවා ගැනීමේ (සංවර්ධනය කිරීමේ) නිර්නායක (මිනුම් දඬු) ලෙස මිනිසා සුඛිත මුදිත කිරීමට පදනම් ලෙස ලෝකය තුළ ක්‍රියාත්මක වුවද දිනෙන් දින වර්ධනය වන මිනිසාගේ දුඃඛිත තත්ත්වය ආත්මාර්ථය ඉහළ යෑම, සාංඝිකත්වය හීනවීම, පාපය රජ කිරීම (ළමා අපචාර, සම ලිංගික විවාහ, ගබ්සාව, සංක්‍රාන්ති ලිංගික වාදය) යුද්ධ (ජාතීන් අතර / රාජ්‍යයන් අතර) දළිඳුකම, උද්ධමනය යනාදි කරුණු තුළ මිනිසාගේ හා ලෝකයේ පරිහානිය දෙස බලද්දී අපගේ ජීවිත රඳවා ගත යුතු ස්ථිර පදනමක අවශ්‍යතාවය අපට මතු වෙයි.
* **"සමිඳුනි, ඔබේ වචනය සදාතනිකය ; එය තිර ලෙස සඟලොව ඇත. ඔබේ විශ්වාසවන්තකම පරපුරෙන් පරපුරට පවත්නේය. ඔබ පොළොව පිහිටෙව් සේක. එය ස්ථිරව පවතී. "**
  (ගීතාවලිය 119:89-90)

04. සාකච්ඡාව හා අවසානය :
1. දේව වචනය අපගේ ජීවිතයේ පදනම කරගත් ජනතාවක් ලෙස ඔබගේ අත්දැකීම් බෙදා ගන්න.
2. දේව වචනය සෙවීම පෞද්ගලික ජීවිතය තුළ, පවුල තුළ මේ කාලය පුරා අවදි වීමට හැකියාව වර්ධනය වුනාද? අත්දැකීම කුමක්ද?
3. ජීවිතයේ මෙන්ම රටේ සමාජයේ පදනමද විය යුත්තේ දේව වචනය යි. සාකච්ඡා කරන්න
4. ලබන මාසය පුරා මේ තුළ ජීවත් වීමට ගින්න අවුළුවන්න කියා ශුද්ධාත්මයාණන්ගේ ස්නාපනය පතා යාච්ඤා කරන්න.

************************